


# පැසිපන්දු ශිල්පය අයියාගෙන් සොරා ගත් මල්ලී - ප්‍රගීත්

**කසුන් සේනාරත්න**

පැසිපන්දු යුරෝපයේ රටවල් රැයක ඉතාමත් ජනප්‍රිය ක්‍රීඩාවක් වුවද ශ්‍රී ලංකාවේ තවමත් එය ජනප්‍රිය ක්‍රීඩාවක් බවට පත් වී නැත.
ශ්‍රී ලංකාවේ ගම්බද පලාතක සංචාරය කරණ විට තැනින් තැන වොලිබෝල් පිටි තිබීම සුලභ දර්ශණයකි. යුරෝපීය රටවල මෙම තත්ත්වය හිමිව ඇත්තේ පැසිපන්දු ක්‍රීඩාවටය.

එම රටවල මග දෙපස අනන්තවත් පැසිපන්දු ක්‍රීඩාවේ නියැලෙන පිරිස් දැකිය හැකිය. එවන් රටක පයින් ගමන් කරණ කෙනෙකුගේ සිරුරේ පැසිපන්දුවක් ගැටී නැත්නම් එයද පුදුමයට කරුණකි.
මැජික් ජොන්සන් නමැති අන්වර්ථ නාමයෙ-න් හඳුන්වන ප්‍රබල පැසිපන්දු ක්‍රීඩකයින් සහභාගි වන සුප්‍රකට තරගාවලි රැසක්ම වාර්ෂිකව යුරෝ පයේ පවත්වන බැවින් පැසිපන්දු ක්‍රීඩාව ලෝකයේ ජනප්‍රිය ක්‍රීඩාවන් අතරේ ලා සැලකිය හැකිය.

යුරෝපයේ පැවැත්වෙන පැසිපන්දු තරගාවලියකට සහභාගිවීම තවමත් ශ්‍රී ලංකාවට සිහිනයක් බව සැබෑය.
කෙසේ වුවත් පැසිපන්දු ක්‍රීඩාව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රධානම තරගාවලිය ජාතික ජ්‍යෙෂ්ඨ පැසිපන්දු තරගමාලාවය. පසුගිය වසරේ එනම් 2006 වසරේ එහි ශූරතාව සුපුරුදු ලෙසම වෙළෙඳ සේවා පැසිපන්දු කණ්ඩායම දිනා ගත්තේය. වෙළෙඳ සේවා පිල ජාතික පිල නියෝජනය කරන ක්‍රීඩකයින් වැඩි පිරිසකගෙන් සමන්විත බැවින්




ලබාගත් එම ජයග්‍රහණය කිසිවෙකුටත් විශ්මයක් වුයේ නැත. නමුත් එම කණ්ඩායම නියෝජනය කළ ප්‍රගීත් කුමාර නම් ක්‍රීඩකයා විශ්මයට පත්කර වන්නක් ත්‍යාග ප්‍රධානෝත්සව අවස්ථාවේ සිදුවී තිබුණි. ඒ ඔහු තරගාවලියේ දක්‍ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානයට නම් කර තිබීමෙනි. ජාතික පිල නියෝජනය කළ ක්‍රීඩකයින් රැසක් හමුවේ තරගාවලියේ හොඳම ක්‍රීඩකයා වීමට ඔහු කිසිවිටක බලාපොරොත්තු නොවූ බැවින් එම ත්‍යාගය සඳහා තම නම ප්‍රකාශ කිරීම ප්‍රගීත්ට අදද අදහාගත නොහැක්කක් වී ඇත. කෙසේ වුවත් එය ඔහුගේ ජීවිතයේ මෙතෙක් උදා වූ ප්‍රීතිමත්ම අවස්ථාව බවට දැන් පත්වී අවසන්ය.

''වෙළෙඳ සේවා කණ්ඩායමේ හැම ක්‍රීඩකයෙක්ම ජාතික පිල නියෝජනය කරපු පළපුරුදු ක්‍රීඩකයින් ඉතින් ඒ වගේ පිරිසක් අතරින් හොඳම ක්‍රීඩකයාවීම කොච්චර අමාරු දෙයක්ද?'' ඒ ප්‍රගීත්ගේ අදහසය.

වත්තල ශාන්ත අන්තෝනි විදුහලේ ආදී සිසුවකු වන ප්‍රගීත් පාසල් පැසිපන්දු පිලේ දක්ෂ ක්‍රීඩකයෙකු ලෙස මතු වී නොතිබුණි. ඔහු පළමුවරට පැසිපන්දු ක්‍රීඩාවට එක්වී ඇත්තේ පාසලේ අවුරුදු 17න් පහල කණ්ඩායම නියෝජනය කරමිනි. ඒ සඳහා ඔහු යොමුකර ඇත්තේ ද එවකට වෙළෙඳ සේවා පැසිපන්දු ක්‍රීඩකයෙකු වු ඔහුගේ සොහොයුරු ප්‍රදීප් පුෂ්පකුමාර විසිනි. එහෙත් ප්‍රගීත්, ප්‍රදීප් සහභාගි වන තරග නරඹන්නෙකු පමණක්ම විය. එහෙත් පසු කලෙක සිය වැඩිමහල් සොහොයුරු ප්‍රදීප් ගේ පුහුණුකරු ජයන්ත රනවන මහතාගේ ඇරයු-මෙන් කැමැත්තක් අකමැත්තත් අතර දෙගිඩියාවෙන් යුතුව පැසිපන්දු පිටියට එක්වූ ප්‍රගීත් දැනට තමන් ලබා ඇති සාර්ථකත්වය වෙනුවෙන් සිය සෙහොයුරාටත් පුහුණුකරුවාටත් තුති පුදති.

''පැසිපන්දු ක්‍රීඩාව කෙරෙහි අයියා සතුව තිබූ කුසලතාවම මා ළඟත් ඇති බව පුහුණුකරු ජයන්ත රණවන මහතාට වැට-හෙන්න ඇති. එතුමා තමයි පැසිපන්දු බීජය මගේ හිත තුළ පැළ කළේ.'' ප්‍රගීත් තමන් අත්කර ගත් ගෞරවය සිය මුල්ම පුහුණුකරුවාට පිරිනමන්නේ එලෙසිනි.
මුල් වරට 1997 වසරේ පැසිපන්දු ක්‍රීඩාවට එක්වූ ප්‍රගීත් 1999 වසරේ ශාන්ත ඇලෝසියස් විදුහල සංවිධානය කළ ආරාධිත පැසිපන්දු තරගාවලියේදී හොඳම ආක්‍රමණිකයා ලෙස සම්මාන දිනා ගනිමින් වැඩි දෙනෙකුග් අවධානයට ලක්වී තිබුණි.

ඔවර්ස් ක්‍රීඩා සමාජයේ සාමාජිකත්වය දරණ ඩෙල්මේජ් සමූහ ව්‍යාපාරයේ විධායක නිලධාරියෙකු ලෙස සේවය කරණ ප්‍රදීප් අද ඔහු සිටින තැනට ඉබේ පාවී ආ ක්‍රීඩකයෙකු වූයේ නැත. නොපසු බට උත්සාහය තම සාර්ථකත්වයට මග පෑදූ බව ප්‍රගීත්ගේ අදහසය.
කෙසේ වුවත් ජාතික පිලට තෝරා ගැනීම සඳහා පැවති පළමු පරීක්ෂණයෙන්ම ජය අත්කර ගත් ප්‍රගීත් කුමාර මේ වනවිට සම්මාන රැසකට හිමිකම් කියා අවසන්ය.

හොඳම ක්‍රීඩකයා - 2001 වසරේ කුරුණෑගල පැවති කණිෂ්ඨ ජාතික තරගාවලිය, හොඳම ක්‍රීඩකයා - 2004 කොළඹ සුපර් ලීග් තරගාවලිය, හොඳම ක්‍රීඩකයා - 2004 වෙළෙඳ සේවා තරගාවලිය, හොඳම ක්‍රීඩකයා - 2005 වෙළෙඳ සේවා තරගාවලිය, හොඳම ක්‍රීඩකයා, ජ්‍යෙෂ්ඨ ජාතික ශූරතාව 2006 මහනුවර ප්‍රගීත්ගේ කුසලතාව සනාථ කළ සම්මාන වලින් කිහිපයකි .දුන් ජාතික පුහුණුකරු අජිත් කුරුප්පු, වෙළෙඳ සේවා පුහුණුකරු රාජු අහමඩ් හා ඩෙල්මේජ් ආයතනයේ කාර්ය මණ්ඩලයටද ප්‍රගීත් කුමාර සිය කෘතවේදී ආචාරය පුදකර සිටියි.

